*සැ. යු.-* 2018.05.11 දින පළ වූ අංක 2,071 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,072 - 2018 මැයි මස 18 වැනි සිකුරාදා - 2018.05.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 274 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූනි මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

273- B 081282— 353 (2018/05)
D 1 -

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්, (කොළඹ දී පවත්වන) බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

කොළඹ 02, හයිඩ් පාර්ක් කෝනර්, අංක 36, 5 වන මහල, යන ලිපිනයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ස්ටෑන්ඩර්ඩ් ඉන්ඩස්ට්‍රියල් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (පීවී 93332) පිළිබඳව වූ කාරණය සම්බන්ධවයි.

*සහ*

නඩු අංකය : HC (සිවිල්) 12/2018/CO.
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම.

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටස ප්‍රකාරව සහ ඊට යටත් අධිකරණය විසින් ගණන් බේරා වසාදැමීමට අදාලව ඉල්ලීමක් පිළිබඳව වූ කාරණය සම්බන්ධවයි.

ඉක්විටි ඉන්වෙස්ට්මන්ට්ස් ලංකා ලිමිටඩ්,
අංක 108 A, 2/1,
මායා ඇවනිව්
කොළඹ 06.

....................................*පෙත්සම්කරු.*

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 06, මායා ඇවනිව් අංක 108 A, 2/1 හි පිහිටි ඉක්විටි ඉන්වෙස්ට්මන්ට්ස් ලංකා ලිමිටඩ් සමාගම විසින් 2018 ක් වූ පෙබරවාරි මස 28 වැනි දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2018 ක් වූ මැයි මස 31 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**එෆ්. ජේ. සහ ජී. ද සේරම්,**
නීතිඥවරු,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

*සටහන* :- එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනයද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2018 ක් වූ මැයි මස 30 වැනි දින පස්වරු 6.00 ට පෙර බාරදිය යුතුය. නැතහොත් තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතු ය.

05 - 662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.